ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2020 ජූනි මස 22 දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2020 අප්‍රේල්

### සමස්ත නිරීක්ෂණ

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ආර්ථිකයට සිදු වූ බාධාවන් හමුවේ 2020 වසරේ අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය දැඩි බලපෑමකට ලක් විය. 2020 වසරේ අප්‍රේල් මාසයේ දී සංචාරක පැමිණීම් නවතා දැමුණු අතර, සමාජ හා ආර්ථික කටයුතු අර්ධ වශයෙන් සීමා කිරීමෙන් ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයන අංශයට සැලකිය යුතු ලෙස බලපෑමක් ඇති විය. ආනයන ආශ්‍රිත සැපයුම් දාමයන්ට බාධාවන් සිදු වීම සහ රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අත්‍යවශ්‍ය නොවන ආනයන සඳහා පනවා ඇති සීමා කිරීම් සමඟ වෙළඳ භාණ්ඩ ආනයන වියදම් ද අඩු විය. සමාජ හා ආර්ථික කටයුතු සීමා කිරීමට පෙර සංක්‍රමණික සේවකයින් පිරිසක් නැවත මෙරටට පැමිණීම සහ විදේශයන්හි සිටින සමහර සංක්‍රමණික සේවකයින්ට ලබා දෙන වන්දි අඩු කිරීම සහ රැකියා අහිමි කිරීම් සමඟ, මාසය තුළ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස පහත වැටුණි. මූල්‍ය ගිණුම තුළ, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන ශුද්ධ ගෙවීමක් වාර්තා වූ අතර, කොළඹ කොටස් වෙළඳපොළ 2020 වසරේ අප්‍රේල් මාසය පුරාම වසා දමා තිබුණි. වැඩි අවිනිශ්චිතතාවයන් සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත ප්‍රමාණවත් ලැබීම් නොමැති වීම හමුවේ ශ්‍රී ලංකා රුපියල 2020 වසරේ අප්‍රේල් මාසයේ පළමු භාගයේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. කෙසේ වෙතත්, වෙළඳපොළ අපේක්ෂාවන් වැඩිදියුණු වීමත් සමඟ මාසයේ දෙවන භාගයේ සිට රුපියල ක්‍රමයෙන් ස්ථාවර වීමට පටන් ගත්තේය. ඉන් පසුව විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වීම, වසර තුළ මේ දක්වා ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම සියයට 3කට වඩා අඩු වීමට උපකාරී විය.




ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩිදුර තොරතුරු ඇතුළත් 'මාසික වෙළඳ විවරණිකාව' ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. සංඛ්‍යාති > ආර්ථික දර්ශක > මාසික වෙළඳ විවරණිකාව (https://www.cbsl.gov.lk/si/node/6181).

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2019 අප්‍රේල් එ.ජ.ඩො. මිලියන | 2020 අප්‍රේල් එ.ජ.ඩො. මිලියන | වෙනස (%) | 2019 ජන.- අප්‍රේල් එ.ජ.ඩො. මිලියන | 2020 ජන.- අප්‍රේල් එ.ජ.ඩො. මිලියන | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 798 | 282 | -64.6 | 3,954 | 2,932 | -25.9 |
| ආනයන | 1,596 | 1,123 | -29.6 | 6,412 | 5,625 | -12.3 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -797 | -840 | | -2,458 | -2,693 | |
| සංචාරක ඉපැයීම් | 315 (ආ) | - | -100.0 | 1,711 (ආ) | 956 (ඇ) | -44.1 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 554 | 375 | -32.3 | 2,171 | 1,975 | -9.0 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | 10 | - | | -24 | -28 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 135 | 138 | | 3,239 | 961 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 29 | 1 | | 267 | 84 | |
| දිගුකාලීන ණය | 106 | 137 | | 572 | 877 | |
| සමස්ත ශේෂය | | | | 285 | -290 | |

**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.
(ඈ) ද්විතීයික සහ ප්‍රාථමික ගනුදෙනු ඇතුළත් වේ.

## වෙළඳ හිඟය හා වෙළඳ මිල අනුපාතය

- **වෙළඳ හිඟය** 2019 වසරේ අප්‍රේල් මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 797 සිට 2020 වසරේ අප්‍රේල් මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 840ක් දක්වා පුළුල් වූ අතර, ආනයනවල පහත වැටීම අභිබවා අපනයන පහත වැටීම මේ සඳහා හේතු විය. සමුච්චිත වශයෙන් සැලකූ විට, වෙළඳ හිඟය 2019 වසරේ පළමු මාස හතර තුළදී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 2,458 සිට 2020 වසරේ පළමු මාස හතර තුළ දී එ.ජ.ඩොලර් මිලියන 2,693ක් දක්වා පුළුල් විය. 2020 වසරේ පළමු මාස හතර තුළ දී වෙළඳ ගිණුමේ හිගය පුළුල් වීම සඳහා බලපෑ ප්‍රධාන අයිතම රූප සටහන 1 මගින් දැක්වේ.
- මේ අතර, අපනයන හා ආනයන මිල ගණන් අතර අනුපාතය දැක්වෙන **වෙළඳ මිල අනුපාතය** 2020 වසරේ අප්‍රේල් මාසයේදී 2019 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 16.4කින් පහත වැටුණු අතර, මේ සඳහා ආනයන මිල ගණන් පහළ යෑමේ වේගයට වඩා වැඩි වේගයකින් අපනයන මිල ගණන් පහළ යෑම හේතු විය.

**රූප සටහන 1: වෙළඳ හිඟය පුළුල් වීම සඳහා දායක වූ ප්‍රධාන අයිතම : 2020 ජනවාරි - අප්‍රේල් (එ.ජ. ඩොලර් මිලියන)**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: මාසික වෙළඳ හිඟය (2019 – 2020)**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 3: වෙළඳ මිල අනුපාතය (2019 – 2020)**




**මූලය** : ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරීත්වය

- සියලුම ප්‍රධාන අපනයන අංශ කැපී පෙනෙන ලෙස පහත වැටීමත් සමග 2020 වසරේ මාර්තු මාසයේ සිට දක්නට ලැබුණු අපනයන පහත වැටීමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවතීම නිසා 2020 වසරේ අප්‍රේල් මාසයේ දී **වෙළඳ භාණ්ඩ අපනයන** ආදායම 2019 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 282ක් දක්වා සියයට 64.6කින් කැපී පෙනෙන ලෙස පහත වැටුණි. රට තුළ ඇඳිරි නීතිය පැනවීම හේතුවෙන් දේශීය නිෂ්පාදන ක්‍රියාවලියට සහ අපනයන ආශ්‍රිත සේවාවන්ට බාධා පැමිණීම මෙන්ම කොවිඩ්-19 වසංගත තත්ත්වය පැතිරීම හේතුවෙන් දේශීය හා ගෝලීය යන

දෙඅංශයේම සැපයුම් හා ඉල්ලුම් දාම වෙත බාධා පැමිණීම, අපනයන ආදායමේ මෙම කැපී පෙනෙන අඩු වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

- 2020 වසරේ අප්‍රේල් මාසයේ දී මාසයේ දී කෘෂිකාර්මික, කාර්මික සහ ඛනිජ යන ප්‍රධාන අපනයන කාණ්ඩ සියල්ලෙහි ආදායම් කැපී පෙනෙන අඩුවීම් වාර්තා කළේය. අපනයන ආදායම පහත වැටීම සඳහා රෙදිපිළි හා ඇඟලුම්, රබර් නිෂ්පාදිත, ඛනිජ තෙල් නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, තේ, මුහුදු ආහාර සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ වැනි ප්‍රධාන අපනයන අඩුවීම මූලික වශයෙන් දායක විය.
- අපනයන පරිමා දර්ශකය හා මිල දර්ශකය යන දර්ශක දෙකම පිළිවෙලින් සියයට 50.6කින් සහ සියයට 28.4කින් පහත වැටුණු අතර, මෙමගින් 2019 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව 2020 වසරේ අප්‍රේල් මාසයේ දී මාසයේ දී අපනයන පහත වැටීම සඳහා අපනයන පරිමාව සහ මිල ගණන් පහත වැටීම හේතු වූ බව පිළිබිඹු වේ.

**රූප සටහන 4: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 5: අපනයන පරිමා දර්ශකය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | 2019 අප්‍රේල් (එ.ජ. ඩොලර් මිලියන) | 2020 අප්‍රේල් (එ.ජ. ඩොලර් මිලියන ) | වෙනස (%) | 2019 ජන.- අප්‍රේල් (එ.ජ. ඩොලර් මිලියන) | 2020 ජන.- අප්‍රේල් (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **617.6** | **160.8** | **-74.0** | **3,111.9** | **2,294.9** | **-26.3** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 29.3 | 16.6 | -43.3 | 165.2 | 126.9 | -23.2 |
| සත්ත්ව ආහාර | 5.1 | 4.3 | -15.2 | 40.4 | 29.7 | -26.3 |
| රෙදිපිළි හා ඇඟලුම් | 357.6 | 65.2 | -81.8 | 1,831.8 | 1,320.1 | -27.9 |
| එයින් ඇඟලුම් | 333.7 | 58.1 | -82.6 | 1,707.0 | 1,222.0 | -28.4 |
| රෙදිපිළි | 16.9 | 5.1 | -69.6 | 91.3 | 70.1 | -23.3 |
| අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය | 7.0 | 1.9 | -72.3 | 33.5 | 28.0 | -16.4 |
| රබර් නිෂ්පාදිත | 52.9 | 24.2 | -54.2 | 285.8 | 220.3 | -22.9 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 23.0 | 0.1 | -99.4 | 106.3 | 54.8 | -48.5 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 26.0 | 9.0 | -65.4 | 134.1 | 95.4 | -28.8 |
| ප්‍රවාහන උපකරණ | 6.6 | 1.4 | -79.3 | 32.7 | 19.1 | -41.5 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 42.9 | 14.5 | -66.1 | 166.9 | 192.2 | 15.1 |
| රසායනික නිෂ්පාදිත | 12.6 | 7.7 | -39.2 | 57.1 | 45.4 | -20.4 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 8.8 | 2.8 | -68.6 | 48.9 | 29.3 | -40.2 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 8.4 | 1.0 | -87.7 | 19.5 | 11.7 | -39.8 |
| සම් භාණ්ඩ සංචාරක භාණ්ඩ හා පාවහන් | 7.5 | 1.0 | -86.2 | 40.7 | 17.6 | -56.7 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 5.5 | 1.3 | -76.0 | 24.6 | 16.3 | -33.4 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 12.2 | 6.2 | -49.0 | 59.4 | 37.7 | -36.4 |
| පිගන්මැටි නිෂ්පාදිත | 2.1 | 0.3 | -83.4 | 9.2 | 6.4 | -30.0 |
| වෙනත් කාර්මික අපනයන | 17.1 | 5.0 | -70.8 | 89.4 | 71.8 | -19.7 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **177.0** | **120.3** | **-32.0** | **824.7** | **626.8** | **-24.0** |
| තේ | 99.0 | 78.4 | -20.8 | 446.2 | 348.4 | -21.9 |
| රබර් | 2.5 | 1.6 | -37.4 | 10.9 | 8.8 | -19.4 |
| පොල් | 23.9 | 14.3 | -40.1 | 111.7 | 84.7 | -24.2 |
| කුළුබඩු | 15.8 | 12.0 | -23.9 | 96.4 | 63.1 | -34.6 |
| එළවළු | 2.7 | 1.2 | -54.8 | 10.8 | 8.1 | -25.5 |
| සකස් නොකළ දුම්කොළ | 3.0 | 1.6 | -46.4 | 10.4 | 6.0 | -42.5 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 7.4 | 4.9 | -33.4 | 34.6 | 44.5 | 28.6 |
| මුහුදු ආහාර | 22.7 | 6.3 | -72.3 | 103.6 | 63.3 | -38.9 |
| **3. ඛනිජමය අපනයන** | **2.3** | **1.0** | **-57.5** | **11.3** | **5.9** | **-48.3** |
| **4. වර්ග නොකළ අපනයන** | **1.3** | **0.3** | **-79.9** | **6.3** | **4.4** | **-29.8** |
| **මුළු අපනයන** | **798.1** | **282.3** | **-64.6** | **3,954.2** | **2,932.0** | **-25.9** |

(අ) තාවකාලික

**මූලයන්:** ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

- ප්‍රධාන වශයෙන් අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන කැපී පෙනෙන ලෙස පහත වැටීම හේතුවෙන් 2020 වසරේ අප්‍රේල් මාසයේදී **වෙළඳ භාණ්ඩ ආනයන** වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,123ක් දක්වා සියයට 29.6 කින් කැපී පෙනෙන ලෙස පහත වැටුණි. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් තෝරාගත් පාරිභෝගික භාණ්ඩ ආනයනයට පහසුකම් සැපයීම නැවැත්වීම ඇතුළුව රජය සහ මහ බැංකුව විසින් 2020 වසරේ මාර්තු සහ අප්‍රේල් මාස වල දී ක්‍රියාත්මක කළ ක්‍රියාමාර්ග ද ආනයන වියදම අඩු වීමට හේතු විය. ආහාර හා පාන වර්ග ආනයන වියදම ඉහළ ගියද, ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන පහත වැටීම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම අඩු වේගයකින් වුවද පහත වැටුණි. අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් ශ්‍රී ලංකා රේගුව විසින් අනුගමනය කළ තෝරාගත් ආනයන නිෂ්කාශනය කිරීමේ ක්‍රියාවලිය සහ රට තුළ ඇඳිරි නීතිය පැනවීම හේතුවෙන් ආනයනය ආශ්‍රිත අනෙක් සේවාවන්ට බාධා පැමිණීම, ගෝලීය සැපයුම් සහ සේවා පහසුකම් දාමයට බාධා පැමිණීම, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් භාණ්ඩ මිල ගණන් පහළ යෑම ආනයන වියදම කැපී පෙනෙන ලෙස පහත වැටීම සඳහා හේතු විය.
- ඒ අනුව, 2020 වසරේ අප්‍රේල් මාසයේ දී පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යන සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩවල ආනයන වියදම පහත වැටුණි. බොරතෙල් සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන් පහළ යෑම (අප්‍රේල් මාසයේ දී බැරලයක් සඳහා සාමාන්‍ය ආනයන මිල එ.ජ.ඩොලර් 19.56) මෙන්ම පිරිපහදු කළ ඛනිජ තෙල් සහ ගල් අඟුරු සාමාන්‍ය ආනයන මිල ගණන් පහත වැටීම හා පිරිපහදු කළ ඛනිජ තෙල් සහ බොර තෙල් ආනයන පරිමා පහත වැටීම ද ඉන්ධන ආනයන වියදම පහළ යෑම සඳහා හේතු විය. යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, ගොඩනැගිලි ද්‍රව්‍ය, තිරිඟු හා ඉරිඟු, ඛනිජ නිෂ්පාදිත සහ ප්‍රවාහන උපකරණ ආනයන කැපී පෙනෙන ලෙස පහත වැටුණි. 2020 වසරේ මාර්තු/අප්‍රේල් මාස වල පැනවූ ආනයන සීමා කිරීම්වලට යටත් වූ විදුලි සංදේශ මෙවලම්, රෙදිපිළි හා උපාංග සහ ගෘහ උපකරණ වැනි ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ද 2020 වසරේ අප්‍රේල් මාසයේදී පහත වැටුණි. කෙසේ වුවද, රට තුළ කොවිඩ් - 19 වසංගතය පැතිරීමත් සමග ප්‍රධාන වශයෙන් සේවා ඇනහිටීම හේතුවෙන් ශ්‍රී ලංකා රේගුවේ එකතු වූ රථවාහන නිදහස් කිරීම හේතුවෙන් 2020 වසරේ අප්‍රේල් මාසයේදී පෙර මාසයට සාපේක්ෂව පෞද්ගලික රථවාහන ආනයන වියදම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මෙයට අමතරව එළවළු, මුහුදු ආහාර සහ කුළුබඩු වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයන ඉහළ යාම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ යටතේ කාණ්ඩ කර ඇති ආහාර හා පාන වර්ග ආනයන වියදම ඉහළ ගිය අතර, අන්තර් භාණ්ඩ යටතේ කාණ්ඩ කර ඇති මූල ලෝහ, පොහොර, කෘෂිකාර්මික යෙදවුම් සහ ආහාර සැකසුම් ආනයන වියදම ද ඉහළ ගියේය.
- 2020 වසරේ අප්‍රේල් මාසයේදී ආනයන පරිමා දර්ශකය සහ මිල දර්ශකය යන දර්ශක දෙකම පිළිවෙළින් සියයට 17.8කින් සහ සියයට 14.4කින් පහත වැටුණු අතර, මෙමගින් 2019 වසරේ

අප්‍රේල් මාසයට සාපේක්ෂව ආනයන පහත වැටීම සඳහා ආනයන පරිමා මෙන්ම මිල ගණන් ද පහත වැටීම හේතු විය.

**රූප සටහන 6: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




**මූලයන්**: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: මාසික ආනයන පරිමා දර්ශකය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2019 අප්‍රේල් (එ.ජ. ඩොලර් මිලියන) | 2020 අප්‍රේල් (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) | 2019 ජන.-අප්‍රේල් (එ.ජ. ඩොලර් මිලියන) | 2020 ජන.-අප්‍රේල් (එ.ජ. ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **308.1** | **302.5** | **-1.8** | **1,220.4** | **1,268.6** | **4.0** |
| ආහාර හා පාන වර්ග | 122.5 | 136.8 | 11.7 | 457.4 | 563.2 | 23.1 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත ෂ්පාදිත | 2.2 | 2.0 | -10.6 | 11.9 | 13.9 | 17.3 |
| කිරි නිෂ්පාදිත | 39.3 | 27.3 | -30.6 | 103.9 | 124.1 | 19.5 |
| එළවළු | 20.9 | 40.9 | 95.9 | 92.6 | 145.6 | 57.3 |
| මුහුදු ආහාර | 16.0 | 18.7 | 16.7 | 66.3 | 65.3 | -1.5 |
| සීනි හා රසකැවිලි | 15.2 | 15.3 | 0.4 | 64.1 | 88.3 | 37.9 |
| කුළුබඩු | 7.4 | 15.3 | 108.0 | 36.5 | 50.2 | 37.5 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 21.6 | 17.4 | -19.3 | 82.3 | 75.8 | -7.9 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 185.6 | 165.7 | -10.7 | 762.9 | 705.4 | -7.5 |
| පෞද්ගලික රථවාහන | 47.6 | 60.4 | 26.9 | 217.4 | 216.8 | -0.3 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 39.8 | 39.4 | -0.9 | 161.6 | 164.8 | 2.0 |
| ගෘහ උපකරණ | 21.5 | 16.0 | -25.9 | 71.7 | 66.5 | -7.2 |
| රෙදිපිළි හා උපාංග | 19.9 | 12.2 | -39.0 | 95.0 | 85.3 | -10.2 |
| විදුලි සංදේශ මෙවලම් | 22.5 | 14.3 | -36.5 | 84.2 | 63.0 | -25.2 |
| ගෘහ හා දැව භාණ්ඩ | 12.7 | 10.4 | -18.0 | 48.7 | 48.3 | -0.8 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 21.5 | 13.0 | -39.6 | 84.5 | 60.6 | -28.2 |
| **2. අන්තර් භාණ්ඩ** | **882.5** | **570.0** | **-35.4** | **3,656.8** | **3,115.7** | **-14.8** |
| ඉන්ධන | 295.0 | 121.8 | -58.7 | 1,313.6 | 1,070.1 | -18.5 |
| එයින් බොරතෙල් | 55.5 | 14.2 | -74.4 | 293.1 | 209.2 | -28.6 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 239.5 | 84.8 | -64.6 | 898.4 | 734.6 | -18.2 |
| ගල් අඟුරු | 0.1 | 22.8 | 36,380 | 122.1 | 126.3 | 3.5 |
| දියමන්ති හා අගනා ගල් වර්ග | 16.9 | 1.5 | -91.2 | 64.6 | 27.2 | -57.9 |
| රෙදි පිළි හා රෙදි පිළි උපාංග | 219.0 | 146.9 | -32.9 | 907.6 | 768.9 | -15.3 |
| කඩදාසි හා ඝන කඩදාසි | 32.8 | 29.1 | -11.2 | 136.5 | 120.0 | -12.1 |
| කෘෂිකාර්මික යෙදවුම් | 16.5 | 18.5 | 12.2 | 61.8 | 69.3 | 12.1 |
| තිරිඟු හා ඉරිඟු | 33.5 | 9.0 | -73.2 | 86.8 | 88.8 | 2.3 |
| මූල ලෝහ | 32.0 | 38.6 | 20.7 | 172.7 | 136.8 | -20.8 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 47.0 | 41.1 | -12.5 | 190.7 | 168.0 | -11.9 |
| රසායනික නිෂ්පාදිත | 66.5 | 64.9 | -2.3 | 273.8 | 255.5 | -6.7 |
| පොහොර | 26.2 | 29.2 | 11.2 | 74.6 | 55.0 | -26.2 |
| රබර් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 16.4 | 13.1 | -20.2 | 68.9 | 80.6 | 17.0 |
| ඛනිජ නිෂ්පාදිත | 36.8 | 12.4 | -66.2 | 85.5 | 52.4 | -38.7 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 43.9 | 43.9 | -0.2 | 219.6 | 223.1 | 1.6 |
| **3. ආයෝජන භාණ්ඩ** | **404.1** | **249.6** | **-38.2** | **1,532.9** | **1,233.4** | **-19.5** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 209.8 | 113.1 | -46.1 | 848.8 | 685.5 | -19.2 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 101.3 | 65.0 | -35.8 | 477.0 | 359.4 | -24.7 |
| ප්‍රවාහන උපකරණ | 92.6 | 71.3 | -23.0 | 204.9 | 187.4 | -8.5 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.4 | 0.2 | -59.3 | 2.2 | 1.0 | -52.5 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.9** | **0.5** | **-38.5** | **2.4** | **7.7** | **214.7** |
| **මුළු ආනයන** | **1,595.6** | **1,122.6** | **-29.6** | **6,412.5** | **5,625.3** | **-12.3** |

(අ) තාවකාලික

**මූලයන් :** ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

- කොවිඩ්-19 වසංගතය පැතිරීම හේතුවෙන් 2020 මාර්තු මස මැද භාගයේ සිට ශ්‍රී ලංකාවට පැමිණෙන සියලුම මගී ගුවන් ගමන් සහ නැව් ගමන් අත්හිටුවීම සමඟ 2020 අප්‍රේල් මාසයේ දී **සංචාරක පැමිණීම්** වාර්තා නොවූ අතර, 2020 වසරේ පළමු මාස හතර තුළ දී සමුච්චිත සංචාරක පැමිණීම්, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ 907,575 ට සාපේක්ෂව 507,311ක් ලෙස පැවතුණි.
- මෙම ප්‍රවණතා සමඟ, 2020 වසරේ පළමු මාස හතර තුළ දී සමුච්චිත **සංචාරක ඉපැයීම්** එ.ජ. ඩොලර් මිලියන 956ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇති අතර, එය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 44.1ක අඩුවීමකි.
- මේ අතර, 2020 අප්‍රේල් මස **විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ** පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 375ක් දක්වා සියයට 32.3කින් අඩු විය. සමුච්චිත පදනම මත, 2020 වසරේ පළමු මාස හතර තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 1,975ක් දක්වා සියයට 9.0ක අඩුවීමක් වාර්තා විය.

**රූප සටහන 8: සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර**




**මූලය**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9: සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**




**මූලයන්**: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

- 2020 වසරේ අප්‍රේල් මාසයේ දී රුපියල්වලින් නාමනය කරන ලද **රාජ්‍ය සුරැකුම්පත්** වෙළඳපොළෙන් එ.ජ. ඩොලර් මිලියන 90ක විදේශීය ආයෝජනවල ශුද්ධ ගෙවීමක් වාර්තා වීම හේතුවෙන්, සමුච්චිත පදනම මත, 2020 වසරේ පළමු මාස හතර තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 451ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය.
- 2020 වසරේ මාර්තු මාසයේ මැද සිට මැයි මැද දක්වා වෙළඳාම අත්හිටුවීම හේතුවෙන් 2020 අප්‍රේල් මාසයේ දී **කොළඹ කොටස් වෙළඳපොළෙහි** විදේශ ආයෝජන වාර්තා නොවිණි.

එමනිසා, 2020 වසරේ පළමු මාස හතර තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් වාර්තා වූ ශුද්ධ ගෙවීම් ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 28ක් විය.

- 2020 වසරේ අප්‍රේල් මාසයේ දී රජය වෙත වූ **දිගු කාලීන දළ ණය ලැබීම්** එ.ජ. ඩොලර් මිලියන 137ක් විය.

## ජාත්‍යන්තර සංචිත

- 2020 වසරේ අප්‍රේල් මස අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 7.2ක් වූ අතර, එය ආනයනික මාස 4.5කට සමාන විය. දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2020 වසරේ අප්‍රේල් මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 10.3ක් වූ අතර, එය ආනයනික මාස 6.5කට සමාන විය.

**රූප සටහන 10: දළ නිල සංචිත සහ සංචිත ප්‍රමාණාත්මකභාවය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

- කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තියත් සමඟ 2020 වසරේ මාර්තු මස අග සිට අප්‍රේල් මැද දක්වා කාලපරිච්ඡේදය තුළ දී තියුණු අවප්‍රමාණය වීමේ පීඩනයකට මුහුණ දුන් ශ්‍රී ලංකා රුපියල එතැන් සිට ස්ථාවර වූ අතර, 2020 වසරේ මැයි මාසයේ දී සැලකිය යුතු අතිප්‍රමාණය වීමක් වාර්තා කළේය. මෙම තත්ත්වය හමුවේ, 2020 වසරේ අප්‍රේල් මස 09 වැනි දින දක්වා එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 9.1කින් අවප්‍රමාණය වූ රුපියල එතැන් සිට, 2020 වසරේ ජූනි මස 22 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී සියයට 2.7ක සමස්ත අවප්‍රමාණය වීමක් වාර්තා කරමින් අතිප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් 2020 ජූනි මස 22 වෙනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී රුපියල, යුරෝ, ජපන් යෙන් සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය වූ අතර, ස්ටර්ලින් පවුම, කැනේඩියානු ඩොලරය සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

**රූප සටහන 11: එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4: තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2018 | 2019 | 2020 (ජූනි 22 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|---|
| එ.ජ. ඩොලරය | -16.4% | +0.6% | -2.7% |
| යුරෝ | -12.7% | +2.6% | -2.5% |
| ස්ටර්ලින් පවුම | -11.4% | -2.8% | +3.3% |
| ජපන් යෙන් | -18.1% | -1.0% | -4.2% |
| කැනේඩියානු ඩොලරය | -9.3% | -3.7% | +1.4% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -7.6% | +1.3% | -0.4% |
| ඉන්දියානු රුපියල | -8.7% | +2.6% | +4.0% |

**මූලය**: ශ්‍රී ලංකා මහ බැංකුව